**#mediaethicsSL #SinhalaPress #lka #Mawbima #Rivira #Lankadeepa #Feb28**

ඉරණවිල කුඩා දරුවකු ලිංගික අපයෝජනයට ලක් කර ඝාතනය කිරීමේ සිදුවීම සම්බන්ධව පළවූ පුවත්පත් වාර්තාවන් දෙස බැලීමේදී විමසුමට ලක් විය යුතු කරුණු කිහිපයක් ඇත.

එක් පුවත්පතක "කෙලෙසා මරලා" යනුවෙන් සිරස්තල යොදා තිබුණු අතර, කෙලෙසීම වෙනුවට ලිංගික අපරාධය හෝ ලිංගික අපයෝජනය යන වචන වඩාත් සුදුසු බව පෙන්වා දෙමු. එසේම ලංකාදීප පුවත්පතේ සිරස්තලයන් මගින් අපරාධය විස්තරාත්මකව දැක්වීම අවශ්‍ය වේද නැතිද යන්නද පාඨකයෙකුට පැන නැගිය හැකි ගැටළුවකි.

මව්බිම පුවත්පතේ මේ සම්බන්ධ ප්‍රවෘත්තිය සඳහා වෙනත් කුඩා දරුවෙකුගේ ඡායාරූපයක් යොදාගෙන තිබූ අතර, සිදුවූ එම ප්‍රමාද දෝශය වෙනුවෙන් කණගාටුව ප්‍රකාශ කිරීමක්ද ඉන් පසු දිනක පුවත්පතක පළ කරන්නට ඔවුන් කටයුතු කර තිබිණි. එසේම ලංකාදීප පුවත්පතේද දින දෙකකදී මේ සම්බන්ධයෙන් පළවූ ප්‍රවෘත්ති දෙකක කුඩා දරුවන් දෙදෙනෙකුගේ ඡායාරූප පළ කොට ඇත. මෙයින් එක් ඡායාරූපයක් හෝ වැරදි බව නොකිවමනාය. කෙසේ නමුත් ඒ සම්බන්ධයෙන් නිවැරදි කිරීමක් තවමත් දක්නට නොලැබුණි. යම් යම් පුවත්පත් තුළ එම වින්දිත දරුවාගේ ඡායාරූපය බොඳ කර හෝ ඇස් වසා හෝ පළ කර තිබූ නමුත්, එවැනි කිසිදු අනන්‍යතා සැඟවීමකින් තොරව එම ඡායාරූපය පළ කර තිබුණු පුවත්පත් වාර්තාවන්ද දක්නට ලැබිණි.

මේ සම්බන්ධයෙන් අපට නැගීමට ඇත්තේ එක් පැනයකි. ඝාතනයට ලක්වූ කුඩා දරුවාගේ ඡායාරූපය ඒ ආකාරයෙන්ම පුවත්පතක පළ කිරීම සදාචාරාත්මකව යෝග්‍ය වේද? එසේත් නැතිනම් එය ගැටළුකාරී නොවේද? ගැටළුකාරී නොවේ නම් යම් යම් පුවත්පත් වින්දිත දරුවාගේ අනන්‍යතාවය සැඟවීමට යම් පියවර ගැනීමේ අර්ථය කුමක්ද? ඒ සඳහා සංවාදයක් ගොඩනැංවීම පාඨක ඔබ සතුවේ.